**ශීර්ෂය 06 - රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 15 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 06 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

**--------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) මෙම වාර්තාවේ 1.6.2(ආ) ඡේදයේ ඇතුළත් නිරීක්ෂණය සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි .

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 1.5.3.(ii) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අගය නිවැරදි නොවීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇති දේපල පිරියත උපකරණ හා දේපල පිරියත උපකරණ සංචිතවල වටිනාකම නිවැරදි නොවුණි . | 2019 ජනවාරි 01 දිනට දේපල පිරියත උපකරණ වටිනාකම නිවැරදි කිරීම. |

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාවලට අනුකූල නොවීම.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | චක්‍රලේඛයේ දී ඇති ආකෘතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛයේ ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කල යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (ආ) | 2019 වර්ෂය අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන ඇමුණුම් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් කර නොතිබුණි | වර්ෂය අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන ඇමුණුම් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් කළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

**1.6.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය.**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු.39,000,000 ක කල්බදු වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල ද්වීගණනයක් සිදු වී තිබුණි. | එක්වතාවක් පමණක් වත්කම් ගිණුම් ගත කල යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (ආ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අගය නිවැරදි නොවීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇති දේපල පිරියත උපකරණ හා දේපල පිරියත උපකරණ සංචිතවල වටිනාකම නිවැරදි නොවුණි. | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අගය නිවැරදිව දැක්විය යුතුය. | ආරම්භක ශේෂයේ රු. 14,095,070 ක වෙනසක් පැවතීමත් , ඡායා පිටපත් යන්ත්‍ර 05 ක් වෙනුවට අත්වැරදීමකින් 10 ක් ඇතුළත් වීමත් හේතුවෙන් අගයන් නිවැරදි නොවුණි. |
| (ඇ) | දේපළ, පිරියත හා උපකරණ ශේෂය නිවැරදි නොවීම නිසා දේපළ පිරියත හා උපකරණ සංචිතයද නිවැරදි නොවුණි. | නිවැරදි දේපළ පිරියත හා උපකරණ ශේෂය මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කල යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (ඈ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි කල්බදු වත්කම් වටිනාකමට රු. 521,040 ක මුද්දර ගාස්තු එකතු කර දක්වා නොතිබුණි. | කල්බදු වත්කම් නිවැරදිව මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි දැක්විය යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (ඉ) | කාර්යාලීය උපකරණ හා ගෘහ භාණ්ඩවල වටිනාකම රු.78,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණි. | කාර්යාලීය උපකරණ හා ගෘහ භාණ්ඩවල වටිනාකම නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | කොමිෂන් සභාව සතුව පැවති රු.875,000 ක් පිරිවැය වූ වාහනයක් 2019 ජනවාරි 09 වන දින රු.1,258,000 කට විකුණා තිබුණු නමුත් මෙම වාහනය සම්බන්ධ තොරතුරු ආරම්භක ශේෂයේ හෝ අපහරණයන් යටතේ ඇතුලත් කර නොතිබුණි. | ආරම්භක ශේෂයේ හා අපහරණයන් යටතේ අදාල වටිනාකම් ඇතුළත් කළ යුතුවේ. | අපහරණය කිරීමට කටයුතු සූදානම් කර තිබූ බැවින් ආරම්භක ශේෂයේ හා අපහරණයන් යටතේ ඇතුලත් නොකරන ලදි. |
| (උ) | 2019 අගෝස්තු 01 දින වෙන්දේසියේදී භාණ්ඩ වර්ග 09 ක් වෙන්දේසි කර, සහ භාණ්ඩ 10 ක් විනාශ කර ඇතත් මේ සම්බන්ධ තොරතුරු අපහරණ යටතේ දක්වා නොතිබුණි. | ආරම්භක ශේෂයේ හා අපහරණයන් යටතේ අදාළ වටිනාකම් ඇතුළත් කළ යුතු වේ. | 2019 අගෝස්තු 09 දිනැති තක්සේරුව ලබාගන්නා අවස්ථාව වන විට අපහරණය කිරීමට කටයුතු සූදානම් කර තිබූ බැවින් ආරම්භක ශේෂයේ හා අපහරණයන් යටතේ ඇතුලත් නොකරන ලදී. |
| (ආ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අගය නිවැරදි නොවීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇති දේපල පිරියත උපකරණ හා දේපල පිරියත උපකරණ සංචිතවල වටිනාකම නිවැරදි නොවුණි. | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අගය නිවැරදිව දැක්විය යුතුය. | ආරම්භක ශේෂයේ රු. 14,095,070 ක වෙනසක් පැවතීමත් , ඡායා පිටපත් යන්ත්‍ර 05 ක් වෙනුවට අත්වැරදීමකින් 10 ක් ඇතුළත් වීමත් හේතුවෙන් අගයන් නිවැරදි නොවුණි. |

**1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1647(ආ)** | වාහන හා ඒවායේ උපකරණ පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | වාහනද ඒවායේ උපකරණද පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් සිදුකල යුතුවේ. | 2020 දී සිදු කිරීමට නිලධාරීන්ට උපදෙස් දී ඇත. |
| (ආ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ | | | |
| | **(i)** 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන චක්‍රලේඛයේ 3.1.1 සිට 3.1.6 දක්වා වගන්ති | 2018 වර්ෂය සඳහා වූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මාස 05 ප්‍රමාදයකින් පසු 2019 අගෝස්තු 28 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | චක්‍රලේඛයේ සඳහන් පරිදි වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2019 මාර්තු 31 දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| | **(ii)** 3.1.4 ඡේදය | පෙබරවාරි 17 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පරිදි ඌනතා හා අතිරික්ත වාර්තා කිරීම හා ක්‍රියාමාර්ග ගැනීම සිදු කර නොතිබුණි. | චක්‍රලේඛයේ සඳහන් පරිදි කටයුතු කළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| **(iii)** 3.1.5 ඡේදය | පෙබරවාරි 26 දිනට පෙර පොදු 47 අනුව අපහරණය කළ යුතු භාණ්ඩ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛයේ සඳහන් පරිදි කටයුතු කල යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| **(iv)** 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන චක්‍රලේඛයේ 03 ඡේදය | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල අභ්‍යන්තර විගණන සැලැස්ම අන්තර්ගත කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් කල යුතුවේ. | ඉදිරි වර්ෂයේදී විගණන සැලැස්මද ඇතුළත් කර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කරමි. |

**(ඇ)** **රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ**

**-------------------------**

| | | | |
|---|---|---|---|
| 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන චක්‍රලේඛයේ සටහන-(i) | මෝටර් රථයක් 2019 දෙසැම්බර් 31 දින අනතුරට ලක්වීම නිසා ඇති වූ අලාභය වන රු.301,962 ක් මුදල් රෙගුලාසි 109 යටතේ පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශය යටතේ දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 109 යටතේ අදාල වටිනාකම් පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශයේ දැක්විය යුතුවේ. | දෙසැම්බර් 31 දින වන විට අනතුරට අදාල තක්සේරු වාර්තා ලැබී නොතිබීම නිසා අදාල ප්‍රකාශය යටතේ දක්වා නොමැත. |

**(ඇ)** **ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය**

**-----------------------------**

| | | | |
|---|---|---|---|
| 4.2.1 ආකෘතිය | ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රසම්පාදන වර්ගය පැහැදිලිව දක්වා නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මේ ආකෘතියේ ප්‍රසම්පාදන වර්ගය පැහැදිලිව දැක්විය යුතුවේ. | අංශවලින් ලබාගත් අවශ්‍යතාවයන්ට අනුකූලව අයිතම සඳහා ඇස්තමේන්තු සකස් කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය.

### 2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කොමිෂන් සභාවෙන් මාරු වී ගිය හා කොමිෂන් සභාව වෙත මාරු වී පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කිරීම ප්‍රමාද වී පැවතුණි. | 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාන මාරු වීම් යන/එන නිලධාරීන්ට අදාල නිරවුල්නොවූ ණය ශේෂ සම්බන්ධනේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 1.6, 1.7 හා 6.3 වගන්ති හා 2004 ඔකතෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛය අනුව කටයුතු කල යුතුවේ. | ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ මාස දෙකක් ඉක්ම යාමට පෙර නිරවුල් කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලේඛනාගාරයට රු. 429,000 ක රාක්ක මිලදී ගැනීමේදී වගකීම් කාලය සම්බන්ධව එකගතාවයකට එළඹී නොතිබුණු අතර රාක්ක මල බැඳීමටද ලක් වී තිබුණි. | ප්‍රසම්පාදනයන්හිදී වගකීම් කාලය සම්බන්ධව එකගතාවයන්ට එළඹිය යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. මල බැඳී ඇති රාක්ක නැවත මාරු කිරීමට හෝ තීන්ත ආලේප කිරීම සඳහා අදාල සැපයුම් කරුවන් වෙත දුරකතනයෙන් දන්වා ඇත. |

**3.2 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සංචිත වාහනයක් සඳහා 2019 වර්ෂයේදී අළුත්වැඩියා සඳහා රු.25,500 ක්ද ඉන්ධන සඳහා රු. 27,724 ක්ද වැය කර ඇතත් මුළු වර්ෂයටම ධාවන කර තිබුණේ කි.මීටර 58 ක් පමණි. | 1997 සැප්තැම්බර් 30දිනැති අංක 353 දරන, 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන හා 2003 ජනවාරි 03 දිනැති අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව සහ මුදල් රෙගුලාසි 771 ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | අධික ඉන්ධන පරිභෝජනයක් හා අධික නඩත්තු පිරිවැයක් දැරීමට සිදුවන රථයක් බැවින් වෙනත් ආයතනයකට පවරා දීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | කොමිෂන් සභාව විසින් ජීප් රථයක් වර්ෂය පුරා ආර්ථික වශයෙන් ඵලදායී ලෙස ධාවනයේ යොදවා නොතිබුණි. | 1997 සැප්තැම්බර් 30 දිනැති අංක 353 දරන, 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන හා 2003 ජනවාරි 03 දිනැති අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව සහ මුදල් රෙගුලාසි 771 ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | අධික ඉන්ධන පරිභෝජනයක් හා අධික නඩත්තු පිරිවැයක් දැරීමට සිදුවන රථයක් බැවින් හදිසි අත්‍යවශ්‍ය රාජකාරි කටයුතු සඳහා පමණක් යොදා ගෙන ඇත. |

**4. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 5 ක් එනම් සහකාර ලේකම් තනතුරු 3 ක්, පද්ධති විශ්ලේශක හා නීති නිලධාරී යන තනතුරු 5 ද ඇතුළුව 2019 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ මුළු පුරප්පාඩු සංඛ්‍යාව 21 ක් පැවතුණි. | අත්‍යවශ්‍ය තනතුරු පවතී නම් පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු වේ. | 2020 ජූනි මස 03 වන දින වන විට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරුවල පැවති පුරප්පාඩු සියල්ල සම්පූර්ණ කර ඇත. ජල නල හා විදුලි කාර්මික නිලධාරීන් බඳවාගෙන ඇත. ප්‍රාථමික ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම 2020 ජනවාරි 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අත්හිටුවා ඇත. |